ත්‍රිකුණාමලය නගර සභාව

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක ප්‍රමාදයකින් පසුව 2016 සැප්තැම්බර් 05 විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ඔක්තෝබර් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2015 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 දෙසැම්බර් 08 දින සභාවේ ලේකම් වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------------

ගිණුම් පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ප්‍රදානය කරන ලද වාහන 10 ක අයිතිය සභාවට පවරා දී තිබියදී ඒවායේ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද මධ්‍යස්ථානයේ ගබඩාවේ පවතින රු. 294,191 ක ඖෂධ තොග ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඇ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ජල ගාස්තු ආදායම රු. 1,084,232 ක් වූ අතර, ආදායම් හා වියදම් ප්‍රකාශනයේ එය රු. 1,056,045 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජල ගාස්තු ආදායම රු. 28,187 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කඩ කාමර කුලී ආදායම රු. 20,039,978 ක් වූ අතර, ආදායම් හා වියදම් ප්‍රකාශනයේ එය රු. 16,620,905 ක් ලෙස දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කඩ කාමර කුලී ආදායම රු. 3,419,073 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී සභාව විසින් රු. 2,705,000 ක මුදලක් වියදම් කර උදුනක් මිලදී ගෙන තිබුණද, උදුනේ පිරිවැය වශයෙන් රු. 1,352,500 ක මුදලක් පමණක් ස්ථාවර වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට ප්‍රදානය කරන ලද රු. 9,900 ක පොත් පත්වල වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) සේවක ණය ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට ඇති ණය මුදල රු. 19,408,227 ක් වුවද, එය රු. 18,678,111 ක් වශයෙන් ගිණුම්වලට ගෙන තිබුණි. එබැවින් සේවක ණය ශේෂය රු. 730,116 ක් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සභාව විසින් රු. 16,887,724 ක මුළු පිරිවැයකට ඉදි කරන ලද ශ්‍රවනාගාරයේ සහ ඉන්ධන පිරවුම් හලෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

(එ) වෙළඳ සංකීර්ණය, සායනික මධ්‍යස්ථානය සහ ගිනි නිවීමේ ඒකකය යන ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඒ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු ආදායම රු. 38,532,710 ක් වුවද එය රු. 30,992,531 ක් වශයෙන් ආදායම් සහ වියදම් ප්‍රකාශනවල පෙන්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වරිපනම් බදු වශයෙන් ලැබී තිබූ ආදායම රු. 7,540,179 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) විගණනයට ලබා ගැනිමට හැකි වූ තොරතුරු අනුව 2015 දෙසැම්බර් 31 දිනට තොගයේ වටිනාකම රු. 4,630,945 ක් වුවද, එය ශේෂ පත්‍රයේ රු. 2,946,536 ක් වශයෙන් දක්වා තිබුණි. එබැවින් තොග ශේෂය රු. 1,684,409 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

---------------------

අවිනිශ්චිත ගිණුමේ ඇති රු. 11,863,654 ක බැර ශේෂයක් නිරවුල් කිරීමට ක්‍රියා මාර්ග නොගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 6,161,644 ක අයවිය යුතු මුදලක් 2003 වර්ෂයේ සිට ගිණුම්වල පවතී. කෙසේ වුවද මෙම මුදල ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) හඳුනාගැනීමට හෝ බේරුම් කිරීමට ක්‍රියා මාර්ග නොගෙන හඳුනා නොගත් බැර ශේෂ එකතුව රු. 4,557,338 ක් 2008 වර්ෂයේ සිට අඛන්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

වර්ෂ ගණනාවක සිට පහත සඳහන් ගිණුම් අයිතමයන් මූල්‍ය ප්‍රකාශනවල අඛන්ඩව දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම අයිතමයන්ගේ පැවැත්ම සනාථ කිරීම සඳහා කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතු කොට ගෙන මෙම අයිතිමයන් සත්‍යාපනය කිරීමට විගණනයේදී නොහැකි විය.

| අයිතමය | මුදල |
|---|---|
| ------------- | ------ |
| | රු. |
| විදුලි පුවරු භාරදීම | 5,010,261 |
| කලින් ලැබූ ආදායම් | 4,545,638 |
| ආදායම එරෙහිව තැබූ තැන්පතු | 4,523,682 |
| කලින් ගෙවීම් | 1,041,246 |
| නොගෙවූ වැටුප් | 921,907 |
| පුස්තකාල තැන්පතු | 728,707 |
| විදුලි තැන්පතු | 340,145 |
| අයකර ගැනීමට ඇති වැඩ | 108,005 |

1.3.6 නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ------------------------------------- | | ------------------ |
| (අ) | නැගෙනහිර පළාතේ මූල්‍ය රීති | |
| (i) | පළාත් මූල්‍ය රීති 433 | සභාව සතු වාහන 38 ක් සම්බන්ධයෙන් වූ මාසික කාර්ය සාධන සාරාංශ නිසි ආකාරයට නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | වාහන වල ඉන්ධන පරිභෝජනය මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතු වුවද සභාව සතු වාහන 38 ක් සම්බන්ධයෙන් අදාලව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 29,061,043 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 34,451,959 ක් විය.

2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
---------------------------------------

සමාලෝචිත වර්ෂයේ සෑම මාසයකම අවසානයට රු. මිලියන 29 සිට රු. මිලියන 51 ක පරාසයක මුදලක් බැංකු ගිණුම්වල පැවති අතර ඒවා පොලී ආදායම් ලැබෙන බැංකු ගිණුම්වල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම්
------------------------------------------------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| (i) වරිපනම් සහ බදු | 40,070 | 36,184 | 86,926 |
| (ii) බදු කුලී | 19,220 | 19,847 | 18,781 |
| (iii) බලපත්‍ර ගාස්තු | 5,423 | 4,532 | - |
| (iv) අනෙකුත් ආදායම් | 28,538 | 25,195 | 324 |

2.3.2 හිඟ කුලී
----------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් නිල නිවාස වල පදිංචිව සිටින නිලධාරීන් තිස් පස් දෙනෙකු විසින් වසර ගණනාවක් සඳහා ගෙවල් කුලී නොගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. 424,593 මුදලක් හිඟ හිට තිබුණි. එසේ වුවද මෙම හිඟ කුලී අයකර ගැනීම සඳහා නිසි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් එළවළු වෙළඳ පොල සහ මත්ස්‍ය වෙළළදපොල කඩකාමර 274 ක් කුලියට දී තිබුණි. කෙසේ වුවද එකතුව රු. 14,899,765 ක කුලී මුදලක් අයකර ගැනීමට නිසි ක්‍රියා මාර්ග නොගෙන වසර 07 කට අධික කාලයක් හිඟ හිටව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්ය සාධනය
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලිඛිත ගිවිසුමකට නොඑළඹී නිල නිවාස හයක් පෞද්ගලික පාර්ශවයකට 2005 වර්ෂයේ සිට සභාව විසින් කුලියට දී තිබුණි. කෙසේ වුවද හිඟ හිටි කුලී අයකර ගැනීමට සභාව විසින් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) 1990 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුලදී පලාත් පාලන කොමසාරිස් හා වෙනත් අමාත්‍යාංශ තුනක් මගින් සභාවට ප්‍රදානය කරන ලද වාහන පහලොවක අයිතිය පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) කුලකෝට්ටම්හි පිහිටි කාමර පහකින් සමන්විත ගෘහ භාණ්ඩ සහිත වූ නිල නිවාසයක් වසර පහක කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර එය අළුත්වැඩියා කොට නැවත පරිහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2016 ජනවාරි 01 දින සිට වසරක කාලයකට රු. 9,639 ක මාසික කුලියට ත්‍රිකුණාමලය බස් නැවතුම් පලහි පිහිටි වැසිකිලය පුද්ගලික පාර්ශවයකට කුලියට දී තිබුණි. කෙසේ වුවද කුලියට ගත් අය විසින් වැසිකිලිය නඩත්තු නොකිරීම හේතු කොට ගෙන බස් මගීන් හට එය භාවිතා කළ නොහැකි බව 2016 ඔක්තෝබර් 11 දින කරන ලද ස්ථාන පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඉ) වෛද්‍ය අපද්‍රව්‍ය පිලිස්සීම අරමුණු කොට රු. 2,705,000 ක වියදමක් දරා සභාව විසින් උදුනක් සපයාගෙන සවිකොට තිබුණි. කෙසේ වුවද විදුලි බල සැපයුම නොමැතිකම හේතු කොටගෙන උදුන ස්ථාපනය කළ 2015 මාර්තු 10 දින සිට අපේක්ෂිත අරමුණු සඳහා එය භාවිතා කර නොතිබුණි.

3.1.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු වෙළඳසැල් 299 කින් වෙළඳසැල් 90 ක්ම 2011 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, මෙම වෙළඳසැල් කුලියට දීමට සභාව මේ දක්වා කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආසන්න වශයෙන් වාර්ෂිකව රු. 2,000,000 ක අලාභයක් සභාවට සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී වෙළඳ සැල් 26 කින් කිසිදු කුලී ආදායමක් සභාවට ලැබී නොතිබුණි.

(ඇ) නගර සභා ආඥා පනතේ 164 (2) වගන්තිය අනුව සභාබල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පවතින හෝටල් වලින් මුළු ආදායම පදනම් කරගෙන අයබදු අයකළ යුතුය. කෙසේ වුවද, 2015 වර්ෂය සඳහා හෝටල් හතරකට අදාලව අයබදු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආසන්න වශයෙන් රු. 530,519 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

3.2.1 මළ අපද්‍රව්‍ය හැසිරවීමේ යන්ත්‍රාගාරය ඉදිකිරීම
---------------------------------------------------

කොන්ත්‍රාත් වටිනාකම රු. 6,401,355 කට මළ අපද්‍රව්‍ය හැසිරවීමේ යන්ත්‍රාගාරය ඉදිකිරීම සඳහා 2012 ජනවාරි 28 දින සභාව විසින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 4,485,156 කට අදාල ගෙවීම් ලබා ගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි.

(ආ) ඉහත සඳහන් කළ පරිදි කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම අර්ධයක් පමණ අවසන් කර තිබියදී අත්හැර දමා තිබුණි. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් ඉංජිනේරු විසින් ඔහුගේ 2014 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින් මුළු කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉදිකළ බවට සහතික කර තිබුණි. ඒ අනුව, රු. 304,491 ක් වූ රඳවා ගැනීම් මුදල් සභාව විසින් කොන්ත්‍රාත්කරුට නිදහස් කර තිබුණි.

(ඇ) සක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම හේතු කොටගෙන කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් දරන ලද මුළු මුදලම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

3.2.2. විදුලි වැටක් ඉදිකිරීම
------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරනු ලබන භූමියේ ආරක්ෂාවට 2014 ජුනි 20 දින රු. 893,060 ක කොන්ත්‍රාත් මුදලකට පළාත් පාලන කොමසාරිස් විසින් විදුලි වැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවිතරයන් සහ රූප සටහන්වලට අනුව ලී කනු දෙකක් අතර විදුලි වැටෙහි දුර ප්‍රමාණය මීටර් 4 ක් විය යුතුය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් මීටර් 33 ක දුර ප්‍රමාණයකින් ලී කනු සිටුවා තිබුණි. එහි ප්‍රතිපලයක් වශයෙන් ස්ථාපිත කර ඇති විදුලි කම්බි 03 එකිනෙකට සම්බන්ධ වී තිබුණි.

(ආ) විදුලි වැටට විදුලිය සපයා නොතිබීම හේතුකොටගෙන කොන්ත්‍රාත්කරු විසින් ස්ථාපිත කර තිබූ බොහොමයක් විදුලි කනු වලට වන අලි විසින් අලාභ හානි සිදු කර තිබුණි.

(ඇ) විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද සියළුම අයිතමයන් එනම් ලී කනු, විදුලි කම්බි යනාදිය හඳුනා නොගත් පුද්ගලයන් විසින් ඉවත් කර ඇති බව 2015 ඔක්තෝබර් 15 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණයේදී නිරීක්ෂණය විය. එබැවින් මෙම වැඩ සඳහා දරන ලද රු. 618,858 ක මුදල ඵල රහිත වියදමක් වී තිබුණි.

3.3 පාරිසරික ගැටළු
------------------

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ නියමනයන් ප්‍රකාරව අදාල අධිකාරින්ගෙන් පාරිසරික ආරක්ෂක බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව ඉන්ධන පිරවුම් හල්, සිමෙන්ති වැඩ පලවල්, ලී වැඩ පලවල්, ගරාජයන් සහ වී මෝල් වැනි ව්‍යාපාරයන් සමහර ආයතන පවත්වාගෙන යනු ලැබේ.(සංශෝධිත පනත් 1980 අංක 55 සහ 2000 අංක 53)කෙසේ වුවද පාරිසරික ආරක්ෂක බලපත්‍ර පිළිබඳව නොසලකා සභාව විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

4. යහ පාලනය සහ ගිණුම් කටයුතු භාවය

---

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස පහක (05) කාලයක ප්‍රමාදයකින් පසුව 2016 සැප්තැම්බර් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 ඔක්තෝබර් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය

---

ඇස්තමේන්තුගත ආදායම හා වියදම සහ තත්‍ය ආදායම හා වියදම් අතර සියයට 16 සිට සියයට 78 දක්වා වූ පරාසයක විචලනයක් නිරික්ෂණය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

4.3 වත්කම් කළමනාකරණය

---

4.3.1 නිෂ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම්

---

අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට ක්‍රියා මාර්ගයක් නොගෙන සභාව සතු වාහන දහනමයක් (19) කාර්යාල පරිශ්‍රයේ වර්ෂ එකේ (01) සිට හතක (07) ක කාලයක් නිෂ්ක්‍රීයව තිබුණි.

4.3.2 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) අයිතම 222 භාණ්ඩ වෙන්දේසියේ විකිණීමට සහ අයිතම 203 ක භාණ්ඩ සහ පුස්තකාල පොත් ඉවත් කිරීමට සහ අයිතම 430 ක භාණ්ඩ හා පුස්තකාල පොත් අළුත්වැඩියා කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද 2016 ඔක්තෝබර් 10 දක්වා මෙම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද භාණ්ඩ සමික්ෂණ මණ්ඩල මගින් පුස්තකාල පොත් 1652 ක ඌනතාවයක් හෙළිදරව් කර තිබුණි. කෙසේ වුවද පුස්තකාල පොත් ඌනතාවයට වගකිවයුතු නිලධාරියා සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග කළමනාකරණය විසින් මේ දක්වා ගෙන නොතිබුණි.

4.4 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවට අදාල තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණිය | 03 | 01 | 02 | - |
| ද්විතික ශ්‍රේණිය | 02 | 02 | - | - |
| තෘතියක | 94 | 50 | 44 | - |
| සුළු සේවක | 186 | 282 | - | 96 |
| වෙනත් (අනියම්/ තාවකාලික) | - | 66 | - | 66 |
| එකතුව | 285 | 401 | 46 | 162 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ ගණකාධිකාරී තනතුර වසර 10 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතියදී එම තනතුරට ස්ථිර නිලධාරියකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය පරිපාලක, වින්නඹු, මහජන සෞඛ්‍ය පරික්ෂක, භාෂා පරිවර්තක, කාර්මික නිලධාරි, වෙළඳ පරිපාලක, මෝටර් කාර්මික සහ ගිනිහට තනතුරු සඳහා වූ පුරප්පාඩු විගණන පරීක්ෂණ දින වූ 2015 ඔක්තෝබර් 10 දින වන තුරුත් සම්පූර්ණ කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ලෙජරය නිසි පරිදි නඩත්තු නොකිරීම සහ ජංගම නොවන වත්කම් සහ ආදායම් වාර්තා නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | ආදායම් සහ වියදම් උපකල්පනය නොකර ආදායම් ඇස්තමේන්තු කිරීම. |
| (ඇ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් එකතු කිරීම සඳහා දීර්ඝ ප්‍රමාදයන් පැවතීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට දීර්ඝ ප්‍රමාදයක් පැවතීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් වැඩ අත්හැර දමා ඇති කොන්ත්‍රාත් කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග නොගැනීම. |